**ශීර්ෂය 160 - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 160 - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 14 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 65,546.94 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 42,315.00 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 23,231.94 ක් හෙවත් සියයට 35.44 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 3,775.65 | 3,757.92 | 17.73 | 0.47 |
| මූලධන | 61,771.29 | 38,557.08 | 23,214.21 | 37.58 |
| **එකතුව** | **65,546.94** | **42,315.00** | **23,231.94** | **35.44** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 16001 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.00 | 11.94 | 5.50 | 9.11 | 48.00 | 35.11 |

**2.3 අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0323/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.260,361 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, තවත් ලේඛන තුනක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛනය හා පොත්පත් | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි අංක 110 | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බඩු වට්ටෝරු ලේඛනය | මුදල් රෙගුලාසි 454 | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

-----------------------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2017 ජුනි 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.755,122,397 ක් විය.

**3.3 විසර්ජන ගිණුම්**

--------------------

**අයවැය විචලනය**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 8,085.50 ක් වූ ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) මූලධන වැය විෂයයන් 13 කට අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 42.79 ක සිට සියයට 97.63 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් වැය විෂයයක් සඳහා රු.මිලියන 43.00 ක ප්‍රතිපාදන ලබා ගෙන එම මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. එසේම වැය විෂයයන් 04 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් එකතුව රු.මිලියන 15.39 ක ප්‍රතිපාදන ලබා ගෙන උපයෝජනයන් කළ පසු ඉතිරිය පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබා ගන්නා ප්‍රතිපාදනයෙන් සියයට 28 ක සිට සියයට 62 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් එම ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව සකස්කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

----------------------------

අමාත්‍යාංශ සතු රු.19,900,000 ක් වටිනා මොටර් රථයක් විධිමත් පරිදි පැවැරීමකින් තොරව විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි.

**3.6 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම**

----------------------------------------------

වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.2,657,679 ක බැරකම්වලට එළඹ තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදි වැය විෂයයන් 04 කට

ප්‍රතිපාදන සලසා නොතිබුණත්, එම වැය විෂයයන්ට අදාළව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,391,233 ක් බැරකම්වලට එළඹ තිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i). මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 304,200 | විවිධ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම, අදාළ අත්තිකාරම් කාර්ය නිම කිරීමෙන් පසු මාසයකට වැඩි කාලයක් අත රඳවා ගැනීමෙන් පසු නිරවුල් කර තිබුණි. |
| (ii). මුදල් රෙගුලාසි 371 (4) | 1,261,184 | අවස්ථා 74 කදී අවශ්‍යතාවය ඉක්මවා නිලධාරීන් වෙත අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |

**3.8 විදේශාධාර ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ව්‍යාපෘති 21 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 30,345.99 ක් වී තිබුණි. එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 18,746.43 ක් උපයෝජනය කර තිබුණි. එම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සිදු කළ නියැදි විගණන පරික්ෂණවලදී අනාවරණය වූ නිරික්ෂණ පහත දැක්වේ.

**(අ) පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්වය සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව ව්‍යාපෘතිය**

ඉහත සඳහන් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තාව අනුව 2016 වර්ෂය සඳහා ඉටුකිරීමට සැලැසුම් කර තිබුණු පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි.

- වන අලි කළමනාකරණ ප්‍රතිපත්ති උපායමාර්ග හා ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කිරීම.
- සැලැසුම් හා ක්‍රියාත්මක කිරීම් කරගෙන යාමට අදාළ ධාරිතා වර්ධනය
- සීමාංකනය නොකරන ලද කැලෑවල මායිම් සීමාංකනය කිරීම

- කහල්ල පල්ලේකැලේ කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම

(ii). 2016 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් රු.මිලියන 1.34 ක කාර්යාල උපකරණ හා ලී බඩු මිලදීගැනීමට සැලසුම්කර තිබුණද, 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමකින් තොරව රු.1,003,016 ක කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ 2016 වර්ෂයේදී මිලදීගෙන තිබුණි.

**(ආ) ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුළුවීම හා පැතිරීම පාලනය සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) පටහැනිව විවිධ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු වෙනුවෙන් අත්තිකාරම් ගෙවීමේදී මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන්ට සහ ව්‍යාපෘතියෙන් පරිබාහිර නිලධාරීන්ටද රු.2,105,925 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

(ii) 2016 ඔක්තෝබර් 22 දින සිට 2016 නොවැම්බර් 01 දින දක්වා දකුණු අප්‍රිකාවේ පැවති ආක්‍රමණශීලී ආගන්තුක ජීවීන් පාලනය හා කළමනාකරණය පිළිබඳ අධ්‍යයන චාරිකාව සඳහා නිලධාරීන් 04 දෙනෙකු සහභාගී වී තිබුණි. ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් දෙදෙනෙකුද එම පුහුණුව සඳහා සහභාගී වී තිබුණි. එම නිලධාරීන් සඳහා අනියම් දීමනාව ලෙස රු.85,404 හා උණුසුම් ඇඳුම් දීමනා ලෙස රු.27,079 ක් ව්‍යාපෘතියේ අරමුදල්වලින් ගෙවා තිබුණි.

(iii) 2016 මාර්තු 28 දින සිට අප්‍රේල් 02 දින දක්වා "ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ පවත්වා තිබූ ශ්‍රී ලංකාවේ ආගන්තුක ආක්‍රමණශීලී ශාක විශේෂයන් පාලනය සහ කළමනාකරණය සඳහා වූ වැඩමුළුව" වෙනුවෙන් එම ආයතනය මිලදී ගන්නා ලද රු.112,500 ක් වූ මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍රයේ වටිනාකමද ඇතුළත්ව තිබුණි. මෙම වැඩසටහන සඳහා විෂයයන් 14 ක් යටතේ රු.831,809 ක් වියදම් කර තිබුණු අතර ඒ සඳහා රු.91,499 ක එකතු කළ අගය මත බදු මුදලක්ද ඇතුළත් කර මුළු වියදම රු.923,308 ක් ලෙස සඳහන් කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ප්‍රංශයේ පැවති " Smart city selection" වැඩසටහන සඳහා සහභාගීවීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ විදේශ ගත වී තිබුණි. අදාළ ප්‍රදාන ආයතනය විසින් දරනු ලබන වියදම් පිළිබඳව තහවුරු කර ගැනීමකින් තොරව සංයුක්ත දීමනාව හා අනියම් දීමනාව ලෙස රු.506,904 (US $ 3,420) ක් ගෙවා තිබුණි.

(ii). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් ගෙවිය හැකි වුවද, ඊට පටහැනිව මැදිරිගිරිය, ලංකාපුර හා වලපනේ ප්‍රදේශවල ගොවි ජනතාව සඳහා කෘෂි උපකරණ බෙදා හැරීම සඳහා රජයේ සංස්ථාවක් මගින් කැති, පිහි හා අලවංගු 10,000 බැගින් මිලදී ගැනීමට රු.12,030,000 ක මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 60 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

**(ඇ) ඕසෝන් ව්‍යාපෘතිය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා අමාත්‍යාංශයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයෙන් බඳවා ගැනීම සිදු කළ යුතු බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි. 2013 නොවැම්බර් 12 දිනැති coordinating committee meeting හිදී ගන්නා ලද තීරණයක් මත ව්‍යාපාතියේ සම්බන්ධීකරණ නිලධාරී (Coordinator officer) හා තාක්ෂණික නිලධාරී (Technical officer) යන තනතුරු 02 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පිටතින් නිලධාරීන් දෙදෙනෙකු සම්පූර්ණ වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගෙන තිබුණි.

(ii). 2016 අප්‍රේල් 04 දින සිට 08 දින දක්වා ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර පවත්වා තිබූ "37 th Meeting of the open – ended Working Group of the parties to the Montreal Protocol "සමුළුව වෙනුවෙන් ඕසෝන් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා සඳහා පමණක් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඇරයුම් කර තිබුණි. එසේ වුවද, ඒ සඳහා අමත්‍යාංශයේ අතිරේක ලේකම් සහභාගී වීම හේතුවෙන් රු.707,511 ක් අනියම් දීමනා, සංයුක්ත දීමනා හා ගුවන් ටිකට්පත් වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් වියදම් කර තිබුණි.

(iii). 2016 ජුලි 15 දින සිට 23 දින දක්වා ඔස්ට්‍රියාවේ වියානා නුවර පවත්වා තිබූ දත්ත සමුළු වෙනුවෙන් එක් නියෝජිතයෙකු සඳහා පමණක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරිසර වැඩටහන මගින් වියදම් කරන බව දන්වා තිබුණි. එහෙත් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිලධාරීන් දෙදෙනෙකු සහභාගීවීම හේතුවෙන් එක් නිලධාරීයෙකු වෙනුවෙන් අනියම් වියදම්, සංයුක්ත දීමනා හා ගුවන් ටිකට් පත් වෙනුවෙන් රු.885,658 ක් අමතරව වැය කර තිබුණි.

(iv). මොන්ට්‍රියල් සංවිධානයේ පාර්ශවකරුවන්ගේ තෙවන අතිවිශේෂ රැස්වීම නියෝජනය කිරීම සඳහා ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා සහභාගී වී තිබුණි. ගුවන් ටිකට්පත්වල ගාස්තුව එක්සත් ජාතීන්ගේ පරිසර වැඩටහනෙන් වැය කරන බව සඳහන් කර තිබුණත්, ගුවන් ටිකට්පත් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් රු.278,000 ක් වැය කර තිබුණි.

**(ඉ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය**

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය වන විට මුළු වියදම රු.මිලියන 49,736.39 වී තිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් හා හදිසියේ ඇති වූ ජල කාන්දුව හේතුවෙන් විවිධ දුෂ්කරතාවලට පත් මහජනතාව වෙනුවෙන් දේශීය අරමුදලින් රු.මිලියන 901.30 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය හේතුවෙන් එම ප්‍රදේශවල මහජනයාට ඔවුන්ගේ නිවාස, ඉඩම්, අනෙකුත් දේපල හා බීමට ලබා ගන්නා ජලය සම්බන්ධයෙන් දුෂ්කරතා රාශියකට මුහුණදීමට සිදු වී තිබුණි. 2017 ජුලි 14 දින වන විට ගෙවා තිබුණු වන්දි පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| පදිංචි කරවීම සඳහා ගෙවූ වන්දි | 7,698,500 |
| අහිමි වූ නිවාස හා ඉඩම් සඳහා වන්දි | 868,498,057 |
| විකල්ප ජීවනෝපාය, වගාහානි, භාණ්ඩ ප්‍රවාහන, දීමනා හා වෙනත් වන්දි | 25,105,237 |
| **එකතුව** | **901,301,794** |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 92 | 37 | 55 |
| (ii) | තෘතියික මට්ටම | 36 | 35 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 200 | 153 | 47 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 102 | 84 | 18 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 02 | - |
| | **එකතුව** | **432** | **311** | **121** |